# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973 (HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk |
| ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk | | |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 250 / 2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திகதி<br>Date | 11/02/2024<br>පැය 1400 |

## මාධ්‍ය නිවේදනය

### 01. අනවසර විදුලි රැහැනක ගැටී පුද්ගලයෙකු මියයාම - කොස්ගොඩ පොලිස් වසම.

2024.02.11 වන දින කොස්ගොඩ පොලිස් වසමේ දූවේමෝදර, පස්මංහන්දිය ප්‍රදේශයේ කුඹුරු ඉඩමක පුද්ගලයෙකු මියගොස් ඇති බවට කොස්ගොඩ පොලීසියට ලද තොරතුරක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 39 ක් වූ කිරිමැටිහක්ත, පස්මංහන්දිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරු 2024.02.10 වන දින සවස් කාලයේ නිවසින් පිටව ගොස් ඇති බවත්, දූවේමෝදර පස්මංහන්දිය අසල පිහිටි කුඹුරු ඉඩමක ආරක්ෂාව සඳහා අනවසරයෙන් අදින ලද විදුලි රැහැනක ගැටී මියගොස් ඇති බවත් පොලිසිය සිදුකල විමර්ශනයේදී අනාවරණය වී ඇත. මෘත ශරීරය සම්බන්ධයෙන් මූලික මහේස්ත්‍රාත් පරීක්ෂණය සිදුකර පශ්චාත් මරණ පරීක්ෂණය සඳහා දේහය බලපිටිය රෝහල වෙත රැගෙන ගොස් ඇත. කොස්ගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

### 02. මාරක රිය අනතුරක් - අඹන්පොල පොලිස් වසම.

2024.02.10 වන දින සවස් කාලයේ අඹන්පොල පොලිස් වසමේ පාදෙනිය අනුරාධපුර මාර්ගයේ අඹන්පොල ප්‍රදේශයේදී අනුරාධපුර දෙස සිට පාදෙනිය දෙසට ධාවනය වූ බවුසර් රථයක මාර්ගය හරහා ගමන් කල පුද්ගලයෙකුගේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ පදික පුද්ගලයා අඹන්පොල රෝහලට ඇතුලත් කර වැඩිදුර ප්‍රතිකාර සඳහා කුරුණෑගල රෝහලට ඇතුලත් කිරීමේදි මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 45 ක් වූ කෝන්කඩවල, අඹන්පොල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය කුරුණෑගල රෝහලේ මෘත ශරීරාගාරයේ තබා ඇත. අනතුර සම්බන්ධයෙන් බවුසර් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. අඹන්පොල පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය
පොලිස් මාධ්‍ය කොට්ඨාසය.